ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

මොඩියුල අංකය - 06

# ඵලදායි ඉගෙනුම් ක්‍රියාකාරකම් සැලසුමක් සකස් කිරීම

ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය

# ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

## මොඩියුල අංකය - 06

## ඵලදායි ඉගෙනුම් ක්‍රියාකාරකම් සැලසුමක් සකස් කිරීම

| | |
|---|---|
| මොඩියුලයේ නම | ඵලදායි ඉගෙනුම් ක්‍රියාකාරකම් සැලසුමක් සකස් කිරීම |
| මොඩියුලයේ අරමුණු | 1. ක්‍රියාකාරකම් සැලැස්මක් සඳහා විෂයමාලාවේ මූලික සංරචක ගළපා ගැනීම.<br>2. ක්‍රියාකාරකම් සැලසුමක් නිවැරදි ව සකස් කිරීමේ කුසලතා ප්‍රගුණ කිරීම.<br>3. ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සැලසුම් කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීම.<br>4. විවිධ ප්‍රවේශ අනුගමනය කරමින් ක්‍රියාකාරකම් සැලසුම් සකස් කර භාවිත කිරීම. |
| අපේක්ෂිත ඉගෙනුම් පල | 1. විෂයමාලා විග්‍රහ කරමින් විෂයමාලාවක මූලික සංරචක මතුකර දක්වයි.<br>2. විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික වැඩ සැලැස්ම සැලසුම් කරයි.<br>3. විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා වාර සටහන් සැලසුම් කරයි.<br>4. විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරකම් (පාඩම්) සැලසුම් කරයි.<br>5. විෂයයට, පාඩමට, ඉගෙනුම්ලාභියාට ගැළපෙන පරිදි විවිධ ක්‍රියාකාරකම් (පාඩම්) සැලසුම් කරයි.<br>6. පාසල්පාදක ඇගයීම් සඳහා උපකරණ සැලසුම් කරයි. |
| මොඩියුලයේ අන්තර්ගතය | 1. විෂයමාලාවක ප්‍රධාන අංග<br>2. විෂයමාලාව හා විෂය අන්තර්ගතය<br>• ජාතික පොදු අරමුණු, පොදු නිපුණතා<br>• විෂයමාලාව හා එහි සුවිශේෂී අරමුණු හා විෂය නිපුණතා<br>• විෂය අන්තර්ගතයෙහි තිරස් හා සිරස් සම්බන්ධතාව<br>3. සිසුන් හා ඔවුන් ඉගෙනගන්නා ආකාරය පිළිබඳ ව<br>• සිසුන්ගේ ඉගෙනුම් රටා, පූර්ව ඉගෙනුම් අත්දැකීම් හා ඉගෙනුම් ගැටළු<br>• සිසුන්ගේ ලැදියා, හැකියා, අවශ්‍යතාව හා විභව්‍යතා<br>• සිසුන්ට බලපාන සමාජ, ආර්ථික, සංස්කෘතික හා භෞතික පරිසරය<br>• සිසුන්ගේ කායික, මානසික, සමාජීය හා බුද්ධිමය සංවර්ධන ලක්ෂණ හා ගති ස්වභාවය |

<table>
<tr>
<td></td>
<td>

4. විවිධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය
    - සිසුන්ට සැබෑ ජීවන ඉගෙනුම් අත්දැකීම් (Real world learning), සුතත්‍ය (Authentic) හා අව්‍යාජ ඉගෙනුම් අත්දැකීම් සඳහා අවස්ථා
    - ස්වයං ඉගෙනුම සහ නිර්මාපී ඉගෙනුම් ප්‍රවර්ධනය
    - (Self-directed and constructive learning)
    - 21 වන සියවසට ගැළපෙන පරිදි සිසුන් තුළ නිර්මාණශීලි (Creative) සහ විචාරාත්මක චින්තනය (Critical Thinking) ප්‍රවර්ධනය
    - 21 වන සියවසට ගැළපෙන පරිදි සිසුන් තුළ සහයෝගී ඉගෙනුම (Collaborative learning) ප්‍රවර්ධනය
    - සන්නිවේදන කුසලතා (Communication skills)
    - මිශ්‍ර ඉගෙනුම, විනෝදාත්මක ඉගෙනුම සහ සහයෝගී ඉගෙනුම ප්‍රවර්ධනය කෙරෙන පරිදි පන්ති කාමර ක්‍රියාකාරකම් කළමනාකරණය
    - තොරතුරු සහ තාක්ෂණය යොදා ගැනීම
5. වාර සටහන් හා පාඩම් සටහන්
    - වාර සටහන්
    - පාඩම් සටහන්
        - අරමුණු පාදක
        - ඉගෙනුම් පල පාදක
        - 5E, නිපුණතා පාදක
6. තක්සේරු / ඇගයීම් උපායමාර්ග සැලසුම් කිරීම
    - සිසු ඉගෙනුම් ප්‍රගතිය නියාමනය කිරීම හා ඉගෙනුම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ ලබාදීම

❖ ඉහත අන්තර්ගතයට අදාළ ව වැඩිදුර අධ්‍යයනය නිර්දේශ කෙරේ.

</td>
</tr>
<tr>
<td>ඉගැන්වීමේ ක්‍රමවේදය</td>
<td>ස්වයං අධ්‍යයනය</td>
</tr>
</table>